ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

2021 ඔක්තෝබර් මස 13 වන දින

චක්‍රලේඛ අංක : පීඑස්/සීඑස්ඒ/චක්‍රලේඛ/9/2021

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියළුම රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්

**<u>විදේශ සංචාර</u>**

2022 අයවැය ලේඛණය මේ වන විට සකස් වෙමින් පවතින බැවින්, මුදල් අමාත්‍යාංශය අදාළ අමාත්‍යාංශ, රාජ්‍ය අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය, විදේශ තානාපති සේවාවන් හා ජාත්‍යන්තර සංවර්ධන අරමුදල් ආයතන සමඟ තාක්ෂණික මට්ටමේ ඇගයීම්වල යෙදෙන බවත්, අයවැය සඳහා විශේෂ යෝජනාවන් හඳුනාගැනීමත් සිදු කරන බැවින්, ඒ සඳහා සියළුම අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා අදාළ නිළධාරීන්ගේ සෘජු දායකත්වය මුදල් අමාත්‍යාංශයට ලබා දිය යුතු බව අතිගරු ජනාධිපතිතුමා විසින් පෙන්වා දී ඇත.

තවද, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති අයවැය කාලසටහන අනුව, 2021 නොවැම්බර් 12 වන දින ගරු මුදල් අමාත්‍යවරයා විසින් අයවැය කථාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත්, ඉන්පසු දෙවන වර කියවීමේ විවාදය මෙන්ම කාරක සභා විවාදයන් පවත්වා දෙසැම්බර් මස 10 වන දින අයවැය ඡන්ද විමසීමට සැලසුම් කර ඇති බැවින්, මෙම කාලය තුල ගරු අමාත්‍යවරුන් නිළ හෝ පෞද්ගලික විදේශ සංචාර සැලසුම් නොකරන ලෙසද, අයවැය සම්පාදනයට මෙන්ම අයවැය විවාද සඳහාද පූර්ණ දායකත්වය ලබා දෙන ලෙස උපදෙස් දී ඇත.

විශේෂ අවස්ථාවන් සඳහා විදේශ තානාපති කාර්යාලවලට විදේශ අමාත්‍යාංශය මගින් අදාළ නියෝජනය ලබා දිය හැකි බවද සඳහන් කරනු කැමැත්තෙමි.

එබැවින්, අත්‍යාවශ්‍ය කටයුතු හැර වෙනත් විදේශ සංචාරවලට මෙම කාලය තුළ සහභාගී වීමෙන් වළකින ලෙස ගරු අමාත්‍යවරුන්, අදාළ නිළධාරීන් දැනුවත් කරන ලෙසද දැනුම් දෙමි.

පී. බී. ජයසුන්දර
ජනාධිපති ලේකම්

ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax: ++ 94 11 2446657
ඉ-තැපැල / மின்-அஞ்சல் / e-mail: prsec@presidentsoffice.lk